මගේ අංක -SMS/HRD/HEU/01 2020.09.16

උපදෙස් පත්‍රිකා අංක 01

සියළුම ප්‍රධාන ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්
පලාත් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>ගෘහ ආර්ථිකය පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික ගෙවතු වගා වැඩසටහන- 2020/21</u>**

<u>හැඳින්වීම</u>

අතිගරු ජනාධිපතිතුමාගේ රට හදන සෞභාග්‍යයේ දැක්මෙහි ප්‍රමුඛ සංකල්පයක් ලෙස ගැනෙන "ඵලදායි පුරවැසියෙක් සතුටින් ජීවත්වන පවුලක්" යන සංකල්පය යථාර්ථයක් බවට පත්කර සමෘද්ධිමත් දේශයක් ගොඩනැඟිම සඳහා හැකිතාක් කාබනික එළවළු සහ පළතුරු පරිභෝජනය ගෘහ මට්ටමින් නිෂ්පාදනය කිරිම සඳහා ගෙවතු ලක්ෂ 20 ක් වගා කිරිමේ වැඩපිළිවෙලෙහි ආරම්භක පියවරක් ලෙස පුද්ගලයා / පවුල, කේන්ද්‍ර කරගත් **ගෘහ ආර්ථිකය සහ පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික ගෙවතු වගා වැඩසටහන- 2020/21 මහ කන්නය** තුළදි හඳුන්වාදීමට අපේක්ෂිතය.

දරිද්‍රතාවය පිටු දකිමින් ආර්ථික හා පෝෂණ වටිනාකමක් ඇතිවන ලෙසට දැනට පවතින ගෙවතු සංවර්ධනය කිරිම හා භාවිතයට ගෙන නොමැති ගෙවතු ආර්ථිකමය වශයෙන් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගෙන ගෙවතු සංවර්ධනය දිගින් දිගටම පවත්වාගෙන යාමේ සම්ප්‍රදායට ප්‍රජාව හුරුකරවීම ද මෙහි එක් අපේක්ෂාවකි.ඒ අනුව ගෘහ ආර්ථිකය සහ පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික ගෙවතු වගා වැඩසටහන ඔක්තෝම්බර් මස තෙවන සතියේදී ආරම්භ කිරිමට සැලසුම් කර ඇත. මේ යටතේ දිවයින පුරා ග්‍රාම නිලධාරි වසම් 14022 ක් ආවරණය වන පරිදි පළමු අදියරේදී ගෙවතු දස ලක්ෂයක් සංවර්ධනය කිරිමට අපේක්ෂිතය.ස්වයං පෝෂිත ගෘහ ආර්ථික සංකල්පය වෙත ශ්‍රී ලාංකීය ප්‍රජාව සවිබල ගන්වමින් ස්වයං පරිභෝජන හා නිෂ්පාදන රටාවකට හුරුවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාවට නැංවීමට රජය සැලසුම් කර ඇති ප්‍රමුඛ කාර්යයකි.

**අරමුණු**

- ජනතාවගේ ස්වයං සහභාගිත්වය සහිත ශක්තිමත් ගෘහ ආර්ථික ඒකක මඟින් පවුල් ඒකක සවිබල ගැන්වීම.
- වසවිසෙන් තොර ආහාර නිෂ්පාදනය වැඩිකර ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරිම.
- පරිසර හිතකාමී ජීවන රටාවකට ජනතාව හුරු කිරිම.
- වසවිසෙන් තොර පෝෂ්‍යදායි නැවුම් එළවලු හා පළතුරු සහිත ආහාර වේලක් ලබාගැනීමට ජනතාවට ඇති අයිතිය සහතික කරමින් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම.
- තම පරිභෝජන අවශ්‍යතා තම ගෙවත්ත තුළ ම සම්පාදනය කර ගැනීමෙන් කුටුම්භ පරිභෝජන වියදම අවම කිරිම.
- තම පරිභෝජනය ඉක්මවා නිපදවන අතිරික්තය මඟින් අමතර ආදායමක් ඉපැයීම.
- සීමිත භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.
- තිරසර ගෘහ ආර්ථික සංකල්පය ප්‍රවර්ධනය

**සංවිධාන ව්‍යුහය**

වැඩසටහනේ සංවිධාන ව්‍යුහය පහත පරිදි වේ.

**ප්‍රධාන මෙහෙයුම් ආයතන**

- සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**ප්‍රධාන පාර්ශව/අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා ආයතන**

- ✓ ආරක්ෂක අමාත්‍යාංශය ( ස්වදේශ කටයුතු අංශය )
- ✓ කෘෂිකර්ම අමාත්‍යාංශය
- ✓ වැවිලි අමාත්‍යාංශය
- ✓ ධීවර අමාත්‍යාංශය
- ✓ සෞඛ්‍ය අමාත්‍යාංශය
- ✓ රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
- ✓ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය , බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය
- ✓ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- ✓ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- ✓ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- ✓ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
- ✓ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- ✓ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව/පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- ✓ පොල් වගා කිරීමේ මණ්ඩලය
- ✓ ශ්‍රී ලංකා ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය
- ✓ ආයුර්වේද දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| 1. | ජාතික මට්ටමේ කමිටුව | වැඩසටහනට සෘජුවම සම්බන්ධ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු ආයතන ප්‍රධානීන් |
| II. | පළාත් කමිටුව | පළාත් ආණ්ඩුකාර, ප්‍රධාන ලේකම්, අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම්, හා අදාළ නිලධාරීන්ගෙන් යුත් කමිටුව |
| III. | දිස්ත්‍රික් කමිටුව | දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව |
| IV. | ප්‍රාදේශිය කමිටුව | ප්‍රාදේශීය ලේකම් ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව |
| V. | ග්‍රාමීය කමිටුව | ග්‍රාම නිලධාරී, කෘ.ප.නි.ස, සමෘද්ධි නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී සහ ක්‍රියාකාරී ප්‍රජාසංවිධාන නියෝජිතයන් ඇතුළත් ග්‍රාමීය කමිටුව. අවශ්‍ය අවස්ථා වලදී විදුහල්පතිවරුන්ද සම්බන්ධ කර ගැනීම සුදුසුය. |

01. ගෙවතු වගා වැඩසටහන තුළ අඩංගු ප්‍රධාන ක්ෂේත්‍ර

**I.** ගෙවතු සඳහා භෝග වර්ග හා සත්ව පාලනය

- පළා වර්ග - බහු වාර්ෂික කතුරුමුරුංගා වැනි පළා වර්ග. පාත්ති වල සිටුවනු ලබන නිවිති, ගොටුකොල, සාරන වැනි පළාවර්ග.
- වැල් බෝග - දඹල, බුලත්,වැනිලා වැනි
- අල වර්ග - බතල, මඤ්ඤොක්කා, ගහල, කහ, ඉඟුරු සහ දේශීය අල වර්ග
- බහු වාර්ෂික පැළ- පොල් පැල, පළතුරු වර්ග(කෙටි කාලීනව ඵලදාව ලබාදෙන බද්ධ පළතුරු පැළ)
- අපනයන බෝග සහ කුළු බඩු - (ගම්මිරිස් , එනසල්, කුරුඳු , රම්පෙ, කරපිංචා සේර වැනි බෝග)
- ගෙවතු මායිම් වල වගා කළ හැකි වටිනා දැව ශාක වගාකිරීම.
- බහු වාර්ෂික ශාක - කොස්, දෙල් , බිලිං, මුරුංගා සහ පුවක්
- ඖෂධ පැළ වර්ග
- හතු වගාව
- මී මැසි පාලනය (මී මැස්සන්ට පැණි ලබාගතහැකි ගෙවතු ගෝචර ශාඛ)
- ගෘහස්ත සත්ත්ව පාලනය- කුකුළු පාලනය
- ආහාර පිණිස මිරිදිය මසුන් වගාව

II. අඩු පෝෂණ තත්වයෙන් පසුවන ළමයින් සිටින පවුල් හා ගර්භනී මව්වරුන් සිටින පවුල් ඉලක්ක කරගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කර ඇති බෝග වලට (බණ්ඩක්කා,දඹල,මැකරල්, තිබ්බටු, මිටි මුරුංගා, ඉන්නල, බතල, වම්බටු, තක්කාලි, දෙහි, ලෙමන් පළාවර්ග වන ගොටුකොළ, කතුරුමුරුංගා, තම්පලා, නිවිති, ද පළතුරු වශයෙන් කෙසෙල්, ගස්ලබු, දෙළුම්, වැල් දොඩම් වැනි පළතුරු ද) ප්‍රමුඛත්වය දී ගෙවත්ත සැලසුම් කිරිමට අවධානය යොමු කිරිම.මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ යටතේ සිටින පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් 6000 කගේ සහයෝගය ලබාගත හැකි අතර ( පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් සඳහා පවුල් 10 බැගින් වන පරිදි ) ඒ අනුව පවුල් 60,000 ක් වැඩසටහනට යොමු කර ගැනීමට නියමිතය.

III. සෑම ගෘහයකම කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම හා පොහොර අවශ්‍යතා තම ගෙවතු තුළදීම සකස් කර ගැනීමට වැඩසටහනට සම්බන්ධ වන ගෘහ ඒකක දිරිමත් කිරීම.

IV. තවද, මේ සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර ක්ෂේත්‍රයන්හි ආයතන සම්බන්ධිකරණය කොට පුහුණු හා උපදෙස් වැඩ මුළු සංවිධානය කර ගත හැකි ය.

## 02. ගෙවතු හඳුනාගැනීම, තෝරා ගැනීම, ලියාපදිංචි කිරීම හා ගෙවතු සම්බන්ධීකරණය

### I. ගෙවතු හඳුනාගැනීම

ඉඩම් අමාත්‍යාංශය යටතේ ඇති, ඉඩම් පරිහරණ සැළසුම් දෙපාර්තමේන්තුව මගින්, දැනටමත් සකස් කර ඇති ගෙවතු ඉඩම් ලේඛනය පදනම් කරගෙන ගෙවතු වගාව සඳහා උනන්දුවක් හා කැමැත්තක් දක්වන ග්‍රාමීය, අර්ධ නාගරික සහ නාගරික මට්ටමින් ගෘහ ආර්ථික ඒකක හඳුනා ගත හැකි ය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල , ප්‍රාදේශීය ගොවි ජන සේවා මධ්‍යස්ථානයන් හි සේවයේ නියුක්ත ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් හා ග්‍රාමීය ප්‍රජාව නියෝජනය කරන ප්‍රජා නායකයින්ගෙන් සැදුම්ලත් **ග්‍රාමීය මෙහෙයුම් කමිටුවක්** මගින් ද්‍රව්‍යමය ආධාර හා උපකාර කළ යුතු ගෘහ ඒකක ග්‍රාමීය මට්ටමේදී වෙන් කර ගැනීම හා ගෘහ ඒකක වලට අවශ්‍ය උපදේශන ඇතුලු අනෙකුත් සේවා ලබා දීමට බැදී සිටී.

**ග්‍රාමීය කමිටු සංයුතිය**

**රජයේ නිලධාරින්**

| | | |
|---|---|---|
| 1 | ග්‍රාම නිලධාරින් | අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය (ස්වදේශ කටයුතු අංශය) |
| 2 | සමෘද්ධි සංවර්ධන නිලධාරි | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 3 | ආර්ථික සංවර්ධන නිලධාරි | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 4 | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර | කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| 5 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 6 | ප්‍රජා සංවිධාන නායකයින් | ගොවි සංවිධාන, කාන්තා සමිති, යොවුන් සමාජ, සමූපකාර සමිති, වැඩිහිටි සමිති, සුභ සාධක සමිති, මරණාධාර සමිති, විශ්‍රාම සමිති හා සංවිධාන නියෝජිතයින් |
| 7 | අනුශාසකවරුන් | ප්‍රදේශයේ විහාරස්ථානවල විහාරාධිපති ස්වාමීන් වහන්සේලා, අනෙකුත් ආගමික පූජකතුමන්ලා සහ ප්‍රදේශයේ පාසල්වල විදුහල්පතිවරු |

### II. ගෙවතු තෝරා ගැනීම

පවුල් තෝරා ගැනීමේදී ග්‍රාමීය කමිටුව විසින් පහත කරුණු සලකා බැලිය යුතුය.

1. ස්වකැමැත්තෙන් ජාතික ගෙවතු වගා වැඩසටහනට සම්බන්ධ වීමට උනන්දුවක් දක්වන ඕනෑම ප්‍රතිලාභියකුට තම වසමේ පදිංචි ඉහත නිලධාරි පස්දෙනා (05) ගෙන් කෙනෙකු යටතේ වැඩසටහන සඳහා ලියාපදිංචි වීමට අවස්ථාව ලබාදීම.

2. මෙහිදී ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත ගෙවතු ලේඛනයේ ඇතුලත් ගෙවතු අතරින් සමෘද්ධි ප්‍රතිලාභි පවුල් වලට අයත් ගෙවතු සඳහා ප්‍රමුඛතාවය ලබාදී ගෙවතු තේරීම.

3. ග්‍රාමීය මට්ටමේ නිලධාරි මඟින් ලියාපදිංචි වන ප්‍රතිලාභින් සක්‍රීයව වැඩසටහනට දායක වීමට දක්වන උනන්දුව හා ගෙවතු වල භෞතික ස්වභාවය පූර්ව විමර්ශනයකින් අනතුරුව වැඩසටහන සඳහා ප්‍රතිලාභින් ලියාපදිංචි කිරිමට කටයුතු කිරිම.

4. එක් එක් වසමේ ග්‍රාමීය කමිටු විසින් වැඩසටහන සඳහා තෝරාගනු ලබන පවුල් සංඛ්‍යාව , ග්‍රාමීය මට්ටමේ නිලධාරින් අතර සාකච්ඡා කර සුදුසු පරිදි බෙදා ගත හැකිය.

III. **ගෙවතු ලියාපදිංචි කිරිම.**

1. ඉහත 2.11 යටතේ ග්‍රාමීය කමිටුව මඟින් හඳුනාගත් පවුල් වසම්භාර නිලධාරින් පස් දෙනා විසින් ලියාපදිංචි කිරිමේ සංකේත අංක අනුව ලැයිස්තු ගත කළ යුතුය.

2. තෝරාගනු ලබන සෑම ගෘහ ඒකකයකටම අදාල මූලික තොරතුරු ඇතුලත් කළ හැකි පරිගණක යෙදවුමක් හඳුන්වා දෙන අතර, එමගින් සෑම ගෘහ ඒකකයක්ම ලියාපදිංචි කිරිමට කටයුතු කරනු ලැබේ.

3. ගෘහ ඒකක ලියාපදිංචි කිරිම සඳහා සකස් කර ඇති පරිගණක App එක තුලට තොරතුරු ඇතුලත් කිරිම මඟින් ලියාපදිංචි සිදුකර කෙටි පණිවුඩයක් මඟින් දැනුම් දීම කළ හැක.

4. ඒ අනුව සෑම නිලධාරියකුගේම අධීක්ෂණයට ලක් වන පරිදි ගෘහ ඒකක ලියාපදිංචි කිරිමට කටයුතු කෙරේ.

5. මීට අමතරව වසම තුළ මෙම වැඩසටහන හා ඒකාබද්ධ වීමට කැමැත්ත දක්වන ඕනෑම අයකුට අවස්ථාව ලබාදීමට වසම්භාර නිලධාරින් හා ග්‍රාමීය කමිටුවට සැලසුම් කර ගත හැක.

**IV. ගෙවතු සම්බන්ධීකරණය**

1. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් අනුයුක්තව සේවය කරන ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් වන සමෘද්ධි සංවර්ධන නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර, ආර්ථික සංවර්ධන නිලධාරී හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් මගින් ගෘහ ආර්ථික ඒකක ප්‍රතිලාභීන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර සම්බන්ධීකරනය පවත්වාගෙන යනු ලබයි. ඒ ඒ ග්‍රාමීය මට්ටමේ නිලධාරියා විසින් ඉටු කරන කාර්ය භාරය අනුව සම්බන්ධිකරණය පවත්වාගෙන යා හැකිය. මෙම සම්බන්ධීකරණ කටයුතු වලදී ඉහත 2.2 හි ප්‍රජා සංවිධාන නායකයින්ගේ සහය ද ලබා ගත හැකි ය.

2. ප්‍රාදේශීය මට්ටමින් ගෙවතු සම්බන්ධීකරණය, විෂය භාර මාණ්ඩලික නිලධාරියකුගේ අධීක්ෂණයට යටත් කොට පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් සංවිධානය කර ගත යුතු ය.

3. දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණය ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අදාල දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් විසින් දිස්ත්‍රික් ලේකම් හරහා රේඛීය අමාත්‍යාංශය සමග සංවිධානය කර ගත හැකි ය.

## 03. ගෘහ ආර්ථික ඒකක අවශ්‍යතා හඳුනා ගැනීම.

I. ග්‍රාමීය මට්ටමේ නිලධාරින් 5 දෙනා විසින්, එක් ග්‍රාම නිලධාරි වසමකින් තමන් යටතේ අධීක්ෂණයට ලක් කෙරෙන පරිදි පවුල් ඒකක වලට අවශ්‍ය බීජ, පැල හා යෙදවුම් අවශ්‍යතා පරිගණක යෙදවුමට ඇතුලත් කිරීම

II. තවද වරින් වර ගෘහ ඒකක වලට අදාළ තොරතුරු යාවත්කාලීන කිරිම (ගෘහ ඒකක භාර නිලධාරී විසින් සිදුකරනු ඇත.)

III. තොරතුරු ඇතුලත් කිරිම කාර්යක්ෂමව සිදුකිරිම සඳහා අවශ්‍යතාවය පරිදි යෞවන සාමාජික සාමාජිකාවන්ගේ සහාය ද ලබාගත හැකිය.

## 04. පුහුණුව, පුහුණු අන්තර්ගතය සහ වැඩසටහන් පැවැත්වීම දැනුවත් කිරීම.

ගෘහ ආර්ථික ඒකක සවිබල ගැන්වීමේ වැඩසටහනට සම්බන්ධිත රේඛීය අමාත්‍යාංශවල හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතනවල **කෘෂි, පශු සම්පත්, ධීවර ක්ෂේත්‍ර** වලට අදාළ තාක්ෂණික දැනුමැති නිලධාරින් මගින්, ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටම් වලදි, ජාතික වැඩසටහනේ අරමුණ, ක්‍රියාත්මක ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරිම් කරනු ඇත. මෙම පුහුණු වැඩමුළු පහත සඳහන් ආයතන සම්බන්ධීකරණය මගින් සංවිධානය කර ගැනිමට දිස්ත්‍රික්, ප්‍රාදේශිය හා ග්‍රාමීය මට්ටමේ නිලධාරින්ට හැකියාව ඇත.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
- පොල් සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ජලජීවි වගා සංවර්ධන අධිකාරිය
- ආයුර්වේද දෙපාර්තමේන්තුව

ජාතික මට්ටමේ පුහුණුව රේඛීය අමාත්‍යාංශය සම්බන්ධිත දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා තාක්ෂණික හැකියාවක් ලබාදෙන නිලධාරින් සඳහා පැවැත්වෙන අතර, දිස්ත්‍රික් පුහුණුව, දිස්ත්‍රික් ලේකම්වරු සඳහා ද පැවැත්වේ. දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩමුළු පැවැත්වීම අදාල සම්බන්ධිත ආයතන වල තාක්ෂණික හැකියාව සහිත සම්පත් දායකයින්ගේ සහභාගිත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් ද, ප්‍රාදේශිය සම්පත් දායකයින්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශිය මට්ටමින් ද පුහුණු වැඩසටහන් සංවිධානය කරගත යුතු ය.

## 05 ප්‍රතිලාභීන් දැනුවත් කිරිම

ග්‍රාමීය මට්ටමින් ප්‍රතිලාභීන් දැනුවත් කිරිම, ඒ ඒ ග්‍රාම නිලධාරි වසමේ, සුදුසු පහසුකම් සහිත, ආදර්ශ ගෙවත්තක් තුළදි ප්‍රායෝගිකව සිදුකළ යුතු ය.

ග්‍රාමීය දැනුවත් කිරිම් කාර්ය සදහා පහත සදහන් තාක්ෂණික හා ව්‍යාප්තිමය සේවා නිලධාරින් සම්බන්ධ කරගැනීමට කටයුතු කළ හැක.

- කෘෂිකර්ම උපදේශකවරු
- පශු සම්පත් සංවර්ධන නිලධාරින්
- පොල් හා වැවිලි බෝග ව්‍යාප්තිමය සේවා සපයන නිලධාරින්
- ජලජීවී නිලධාරින්
- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්

## 06. යෙදවුම් සැපයීම

- ප්‍රතිලාභින් වෙත සපයනු ලබන බීජ, කෘෂි දේශගුණික කලාප අනුව උචිත එළවළු වර්ග 06 කින් යුක්ත බීජ වලින් සමන්විත වන අතර, එකම දේශගුණික කලාපය තුළ වුවද ආසන්න ගෘහ අතර බීජ බෙදාදීම විවිධත්වයෙන් යුතුව සිදු කරනු ඇත. ඒ තුළින් ගෘහ ඒකක අතර අතිරික්තය හුවමාරු කරගැනීමට ඉඩ සලසා ඇත.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බීජ නිපදවන හා දේශිය හා වැඩි එලදාවක් සහිත බීජ නිෂ්පාදකයන් දිරිගැන්වෙන පරිදි දේශිය බීජ සැපයුම්කරුවන්ගෙන් බීජ අවශ්‍යතාවය සපුරා ගැනීමට සැලසුම් කළ යුතුය.

- ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ බීජ බැංකු වැඩසටහනේ සහායද මේ සදහා ලබාගත හැක.

- පරිගණක යෙදවුම මගින් හදුනාගත් ගෘහ ඒකක අවශ්‍යතාවය, අදාල දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සෘජුවම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණය යටතේ ප්‍රාදේශිය ලේකම්වරු වෙත සපයනු ඇත. ඒ සඳහා දැරීමට සිදුවන ප්‍රවාහන පිරිවැය, බීජ පිරිවැයටම ඇතුලත් කිරිමට, කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වී කටයුතු කළ හැකි ය.

- එක් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වලට ලැබෙන බීජ කට්ටල ප්‍රාදේශිය ලේකම් විසින් අදාල වසම භාර නිලධාරින් වෙත, අධීක්ෂණ නිලධාරින් මගින් ලබාදීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ඇත.

- වසම් භාර නිලධාරින් විසින් බීජ සිටුවීමට නියමිත දිනට, විධිමත්ව සකස්කර ඇති ගෙවතු සඳහා බීජ ලබාදීමට වගබලා ගත යුතු ය.

## 07 එළවළු පැල ලබාදීම සඳහා පැල තවාන්කරුවන් සමඟ සම්බන්ධීකරණය

- යම් වසමක එළවළු සහ පළතුරු පැල ඌණතාවය ආසන්න වසමක තවාන්කරුවන්ගෙන් සපයා ගත හැකි පරිදි සැලසුම් සකස්කර ගත යුතු ය.
- එළවළු සහ පළතුරු පැල ලබාගැනීමේදි හැකිතාක් දිස්ත්‍රික්කය තුල ඇති පැල තවාන් වලින් ආවරණය කර ගැනීම.
- පළතුරු පැල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිපදවන බද්ධ පැල කහ පැහැති ලේබල් සහිතව නිපදවීම.
- පළතුරු පැල, බීජ පැල හා අතු පැල බීජ පනතේ නිර්දේශ අනුව ලේබල් සහිතව සකස් කිරිම.
- පොල් පැල පරිසර හිතකාමී දිරාපත් වන ද්‍රව්‍ය යොදා සැකසූ ඇසුරුමක බහා ආරක්ෂිතව බෙදා හැරීමට සැලසුම් කිරිම.
- පොල් පැල වැඩි ඵලදාවක් සහිත ඉක්මනින් ඵල දරණ ඒවා විය යුතුය.
- සුළු අපනයන බෝග පැල සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පැල තවාන් මගින් සැපයීම.
- ඔසුපැල ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පැල තවාන්කරුවන් මගින් සපයනු ඇත.
- ගෘහස්ථ කිකිළි පැටව් ගෙවතු හිමියන්ගේ ඉල්ලීම මත (එක් නිවසකට 05 බැගින් ) දිස්ත්‍රික් වල අවශ්‍යතා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ඇත.
- පොකුණු තුළ මසුන් වගාව සහ ජලජීවි වගා සඳහා උපදෙස් හා මගපෙන්වීම සඳහා ශ්‍රී ලංකා ජලජීවි වගා සංවර්ධන අධිකාරියේ සහය ලබාගත යුතුය.

## 08. බීජ වලට අමතරව එළවළු පැල ලබාදීම.

- එක් ගෙවත්තකට වම්බටු, මිරිස්, තක්කාලි,මාලු මිරිස් යන එක් වර්ගයකින් පැල 06 බැගින් පැල 24 ක් ලබාදෙනු ලැබේ.

- මෙම පැල සැකසීම ගම් මට්ටමේ සමෘද්ධි පැල තවාන් වල සිදු කරන අතර,පැල සඳහා අවශ්‍ය බීජ, පැල කිරිමේ බඳුන් හා මූලික පුහුණුව පැල තවාන්කරුවන් වෙත ලබාදිය හැක. එම පැල ගෙවතු වැඩසටහන ආරම්භ කිරිමට දින 03 කට පෙර ගෙවතුහිමියන් වෙත ලබාදිය යුතුය.

- එළවළු පැල වල ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින්, තවාන්කරුවන් සිය තවාන් තුළ කොහුබත් බඳුන් තුළ බීජ සිටුවා තැටිවල තැන්පත් කර නිපදවිය යුතු ය. ශක්තිමත් මූල මණ්ඩලයක් සහිත නිරෝගි පැල නිෂ්පාදනය කෙරෙහි තවාන් කරුවන් උනන්දු කළ යුතු ය.
- එක් නිවසකට පැල 24 ක් ලබාදීමට හැකිවන පරිදි අවශ්‍ය බීජ, ප්ලාස්ටික් ට්‍රේ/ කඩදාසි පල්ප් වලින් නිමකළ බිත්තර රඳවන තැටිවල නිපදවිය යුතුය.එහි වගා මාධ්‍ය ලෙස කොහුබත්, ගංගා වැලි, කොම්පෝස්ට් 1:1:1 අනුපාතයට මිශ්‍ර කර සකස් කළ යුතුය. ඒ සඳහා සුදුසු ආලෝක පාලනයක් හා ජලය නිසි පරිදි ලබාදීමට සැලසුම් කරගත යුතුය. ඒ සඳහා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ උපදෙස් ලබාගත හැක.

## 09. ගෙවත්ත සුදානම් කිරිම හා පැල සිටුවීම

- 2020 ඔක්තෝම්බර් මස මහ කන්නය ප්‍රමුඛ කොටගෙන ගෘහ ආර්ථික දස ලක්ෂයක් සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන ආරම්භ කරන අතර, වසම්භාර නිලධාරින් එදිනට පෙර ප්‍රතිලාභී ගෙවතු සුදානම් කර බීජ පැකට් ලබාදීම සඳහා සැලසුම් කළ යුතුය.

- මෙහිදි තාක්ෂණික හා ව්‍යාප්තිමය සේවා නිලධාරින්ගේ සම්පත් දායකත්වයෙන් තෝරාගත් ආදර්ශ ගෙවත්තකදී ප්‍රතිලාභින් සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමට සැලසුම් කිරීම.

- එහිදි ගෙවත්ත සකස් කිරිම , බෝග තෝරාගැනීම, බෝග සිටුවීම, නඩත්තුව, රෝග හා පළිබෝධ පාලනය, කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබද ප්‍රතිලාභීන් දැනුවත් කිරිම.

- ජාතික වැඩසටහනට පුර්වයෙන් ප්‍රාදේශිය මට්ටමින් බීජ, පැල හා යෙදවුම් ද්‍රව්‍ය අවශ්‍යතා සියලුම ප්‍රතිලාභින් අතට පත් කිරිම සඳහා අධීක්ෂණ නිලධාරීන්, වසම් භාර නිලධාරින් මෙහෙයවීමේ වගකීම ප්‍රාදේශිය ලේකම් වෙත පැවරෙන අතර, ජාතික වැඩසටහනට සමගාමීව පැල සිටුවීමේ වැඩසටහන ප්‍රාදේශිය මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ යුතුය.

- ජාතික වැඩසටහනට සමගාමීව සියලුම රාජ්‍ය ආයතන සහ පාසැල් පරිශ්‍රයන් තුළ පැල සිටුවීමේ වැඩසටහන සඳහා එක්වීමට දැනුවත් කළ යුතු ය.

## 10. යෙදවුම් ද්‍රව්‍ය ප්‍රවාහනය

- යෙදවුම් ද්‍රව්‍ය සපයන ආයතන විසින් දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශිය ලේකම් සම්බන්ධීකරණයෙන් අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ප්‍රාදේශීය නිලධාරීන්ගේ අධික්ෂණයෙන් ප්‍රතිලාභීන් වෙත ලබා දීමට පහසු වන පරිදි ග්‍රාම සේවා වසම තුළ ග්‍රාමීය කමිටු විසින් තීරණය කරනු ලබන ස්ථානයකට පැල තවාන් කරුවන් විසින් අදාල පැල ප්‍රවාහනය කළ යුතුය. එම පැල කෘෂිකර්ම පර්යේෂණ නිෂපාදන සහකාර හෝ සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් භාරගත යුතුය.

## 11. අධීක්ෂණය, පසුවිපරම, ප්‍රගති සමාලෝචනය

- ක්‍රියාත්මක වැඩසටහනට සම්බන්ධව ගෘහ ආර්ථික ඒකක අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු ග්‍රාමීය මට්ටමේදී වසම් භාර නිලධාරින් 5 දෙනාගෙන් සමන්විත ප්‍රජා නායකයන්ගෙන් සැඳුම්ලත් ග්‍රාමීය කමිටුව මඟින් සිදු කළ යුතුය.

- ගෘහස්ථ ප්‍රගති වාර්තා වසම් භාර ග්‍රාමීය මට්ටමින්, නිලධාරින් සෑම ගෘහ ඒකකයක් සඳහාම සකස් කළ යුතු ය.

- ඒ ඒ ගෘහ ඒකකය සඳහා දැනුවත් කිරිම්, පුහුණුවීම් වලට සම්බන්ධවීම, බීජ, පැල, යෙදවුම් ද්‍රව්‍ය නිකුත් කිරිම්, බෝග ඵලදා විස්තර, පරිභෝජනයට ගත් ප්‍රමාණය අතිරික්ත ආදායම් ලැබීම් පිළිබඳව ගෘහයේ තොරතුරු ඇතුලත් කිරිමට පරිගණක App එක තුළ පහසුකම් සපයනු ඇත.

- වැඩසටහනේ දිස්ත්‍රික් මට්ටමේ අධීක්ෂණය දිස්ත්‍රික් ලේකම් ප්‍රමුඛ කෘෂිකර්ම කමිටුවට පැවරෙන අතර ප්‍රාදේශීය මට්ටමේ අධීක්ෂණය ප්‍රාදේශිය ලේකම් ප්‍රධාන කොට ඇති ප්‍රාදේශිය කෘෂිකර්ම කමිටුව වෙත පැවරේ.

- ප්‍රාදේශිය ලේකම් විසින් වසම් මට්ටමේ නිලධාරින්ගේ කටයුතු අධීක්ෂණය සඳහා පසු විපරම් වාර්තා ලබා ගැනීම, ප්‍රගති වාර්තා ලබා ගැනීම හා එහි සාරාංශ කිරීමේ කාර්ය සඳහා ප්‍රාදේශිය මට්ටමේ මාණ්ඩලික නිලධාරින් අධීක්ෂණය සඳහා පත් කර ගත යුතුය.

- එම ප්‍රගති වාර්තා මාසිකව පැවැත්වෙන ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී ද, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී ද සමාලෝචනයට ලක් කළ යුතුය.

- ගෘහ ආර්ථික සංවර්ධන ගෙවතු වැඩසටහනෙහි ප්‍රධාන ක්ෂේත්‍ර 03 ම අදාල අමාත්‍යාංශ වල ග්‍රාමීය මට්ටමට පත් කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ප්‍රාදේශීය මට්ටමේ ප්‍රගතිය සිය රේඛිය අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමට සැලසුම් කර ගත යුතුය. එම අමාත්‍යාංශ වල මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී සමාලෝචනයට ලක් කිරීම වැදගත් වේ.

- මෙම ගෘහ ආර්ථික ගෙවතු වගා වැඩසටහන වසර 05ක් යන තුරු අඛණ්ඩ අධීක්ෂණය, පසු විපරම හා ප්‍රගති සමාලෝචනය මඟින් ප්‍රජාවට දෛනික සාමාන්‍ය ජීවිතයේ අංගයක් බවට මෙම වැඩසටහන පවත්වා ගෙන යාමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීමට ග්‍රාමීය මට්ටමේ හා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් සමත් විය යුතුය.

12. ගෙවතු වගා වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරීන්

| නම | තනතුර හා ආයතනය | දුරකථන අංකය |
|---|---|---|
| ජී.ඩී.ඩී.කුමාර මයා | අධ්‍යක්ෂ, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 071-1270705 |
| අජිත් පුෂ්පකුමාර මහතා | අධ්‍යක්ෂ - කෘෂිකර්ම අමාත්‍යාංශය | 071-2882385 |
| ජයන්තා ඉලංගකොන් මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 071-4427016 |
| රසික හේමජිත් ද සිල්වා මයා | කොමසාරිස් (සේවා), ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 077- 3941044 |
| විශේෂඥ වෛද්‍ය ලක්මිණි මාගොඩරත්න මිය | අධ්‍යක්ෂ(වැ.බ),පෝෂණ අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය | 071-9699323 |
| රන්සිළු වටවල මහතා | අධ්‍යක්ෂ<br>උක්,බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්,කුරුඳු,කරාබු නැටි,බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 071-4405503 |
| සේනක ද සොයිසා මහතා | ජ්‍යෙෂ්ඨ කළමනාකරු,<br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 076-1494094 |
| සුදීපා සුගතදාස මිය - | විද්‍යාඥ වනස්පති -<br>ආයුර්වේද දෙපාර්තමේන්තුව | 071-8103877 |
| කේ.බී.සී.පුෂ්පලතා මිය | අධ්‍යක්ෂ<br>ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය | 071-8661416 |
| ඊ.එම්.එම්.ඒකනායක මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-<br>පොල් වගා කිරීමේ මණ්ඩලය | 076-6905275 |

පවුල් ඒකක සවිබලගැන්වීමේ ජාතික ගෙවතු වැඩසටහන ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා ඔබ විසින් ලබාදෙනු ලබන සහයෝගය බෙහෙවින් අගය කරමු.

මේජර් ජනරාල් විශ්‍රාමික ඒ. කේ. සුමේධ පෙරේරා
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය 15/04/2020

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

මේජර් ජනරාල් විශ්‍රාමික කමල් ගුණරත්න
ලේකම්
අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු
හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

මේජර් ජනරාල් සංජීව මුණසිංහ
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය,
ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා
ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය

එල් එල් ඒ විජේසිරි
ලේකම්
වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු,
මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය ,
බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ
කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

පිටපත්

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අදාල සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්
4. අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් (ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය)
5. විගණකාධිපති



11